සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 06 | විෂයය / பாடம் / Subject ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper I,II | කාලය / காலம் / Time පැය 02 |

නම :- .................................................................................... විභාග අංකය :- ...........................

I කොටස

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* අංක 1 -20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන අතරින් වඩාත්ම වැදගත් වන්නේ මින් කුමක්ද?
(1) වර්තමානය යහපත් කර ගැනීම ය.
(2) අතීතයේ සිදුවීම් දැන ගැනීම ය.
(3) වර්තමානය යහපත් කරගෙන අනාගතය සැලසුම් කිරීම ය.
(4) වර්තමානය තුළින් අනාගතය සැලසුම් කිරීම ය.

(02) අපේ රටේ ඉතිහාසය පිළිබඳ ලියවී ඇති මහාවංසයේ මුල් කොටස රචනා කොට ඇත්තේ කවුරුන් විසින්ද?
(1) මහානාම හිමි (2) ධර්මසේන හිමි
(3) බුද්ධඝෝෂ හිමි (4) ශ්‍රී රාහුල හිමි

(03) මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිතා කිරීම පිළිබඳ සාධක හමුවී තිබෙන්නේ කුමන රටකින්ද?
(1) තුර්කියෙන් (2) චීනයෙන් (3) ඇෆ්ගනිස්ථානයෙන් (4) ඊශ්‍රායලයෙන්

(04) ◆ අදහස් හුවමාරු කරගැනීම ◆ සංගීතය භාවිතා කිරීම
◆ චිත්‍ර ඇඳීමේ හැකියාව ◆ සාරවත් දේ නිපදවීම
ඉහත දක්වා ඇති දේ සිදු කිරීමට හැකිවූයේ කුමන මානවයාටද?
(1) හෝමෝහැබිලස් ය. (2) හෝමෝසාපියන්ට ය.
(3) ඔස්ට්‍රොලෝපිතිකස්ට ය. (3) හෝමෝඉරෙක්ටස්ට ය.

(05) පරිණාමයට පත්වූ වානර මානවයාගේ ස්ථිර වාසස්ථාන සහිත ගම්මාන බිහිවීම සිදුවන්නේ,
(1) මහා හිම යුගයේදී ය. (2) පුරා ශිලා යුගයේදී ය.
(3) නව ශිලා යුගයේදී ය. (4) මධ්‍ය ශිලා යුගයේදී ය.

(06) ලෝකයේ මුල් වරට වී ගොවිතැන ආරම්භ වූ රට කුමක්ද?
(1) මෙක්සිකෝව (2) චීනය (3) තුර්කිය (4) ඉන්දියාව

(07) ශිෂ්ටාචාර ආරම්භවීමටත් පෙර සමාජය තුළ දුප්පත් හා පොහොසත් වශයෙන් දෙපිරිසක් බිහිවන්නේ කුමන හේතුව නිසාද?
(1) අධ්‍යාපන මට්ටමේ ඇතිවූ වෙනස්කම් නිසා ය.
(2) අනුගමනය කළ සිරිත් විරිත් අනුව ය.
(3) ඉදිකරගත් නිවාස වල පැවති ලක්ෂණ අනුව ය.
(4) අස්වැන්න ලබා ගැනීමේදී ඇතිවූ වෙනස්කම් නිසා ය.

Department of Education - Western Province

(08) ලෝකයේ පැරණිම සාහිත්‍ය කෘතිය අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයටද?
(1) මෙසපොතේමියා (2) ඊජිප්තු
(3) හොවැංහෝ (4) ඉන්දුනිම්න

(09) විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩබසින ලද තම්බපණ්ණි වෙරළ පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයකද?
(1) උතුරු මුහුදු වෙරළෙහි ය. (2) දකුණු මුහුදු වෙරළෙහි ය.
(3) නැගෙනහිර මුහුදු වෙරළෙහි ය. (4) බටහිර මුහුදු වෙරළෙහි ය.

(10) ගල් යුගයේ ලංකාවේ ජීවත් වූ ජනතාව ඇටසැකිලි වල රතු පාට ආලේප කිරීමෙන් පෙනී යන්නේ ඔවුන්,
(1) ගල් කැඩීමෙන් ජීවත් වූ බව ය.
(2) සායම් වර්ග නිපදවූවන් බව ය.
(3) අවමංගල චාරිත්‍ර අනුගමනය කළ බව ය.
(4) ඇටසැකිලි විසිතුරු බඩු වශයෙන් භාවිතා කළ බව ය.

(11) මුල් කාලීන ගොවියන් ධාන්‍ය භාවිතා කළ බවට තොරතුරු ලබාදෙන සාක්ෂියක් වන්නේ,
(1) ඇඹරුම් ගල් සොයාගත හැකිවීම යි.
(2) මැටි වළං සොයාගත හැකිවීම යි.
(3) හේන් වල නටබුන් පැවතීම යි.
(4) කැති පිහි වැනි ලෝහ උපකරණ හමුවීම යි.

(12) විජය කුමරු සමඟ පැමිණි ජන කොටස හැඳින්වීමට භාවිතා කරන නම කුමක්ද?
(1) යක්ෂයෝ (2) ද්‍රවිඩයෝ (3) අනාර්යයෝ (4) ආර්යයෝ

(13) පණ්ඩුකාභය රජතුමාගේ රාජ්‍ය පාලනය තුළ දැකිය හැකි වූ විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
(1) නගරය ඉතා අලංකාර කිරීම (2) නගරයේ රෝහල් ඉදි කිරීම
(3) ආගමික සහජීවනය ගොඩනැගීම (4) සෑම බාධකයක්ම ජය ගැනීම

(14) ථූපාරාම චෛත්‍යය සකස් කිරීම සඳහා මිහිඳු හිමියන් උපදෙස් දෙනු ලැබුවේ කෙසේද?
(1) තෙල්ලි ගෙඩියක හැඩයට සමාන විය යුතු බවයි.
(2) සණ්ඨාරයක හැඩයට සමාන විය යුතු බවයි.
(3) වී ගොඩක හැඩයට සමාන විය යුතු බවයි.
(4) දිය බුබුලක හැඩයට සමාන විය යුතු බවයි.

Department of Education - Western Province

(15) ශ්‍රී ලංකාවේ මෙහෙණි සසුන ආරම්භ වන්නේ,
(1) අනුලා දේවියගෙනි. (2) සෝමා දේවියගෙනි.
(3) විහාරමහා දේවියගෙනි. (4) කල්‍යාණවතී බිසවගෙනි.

(16) සද්ධාතිස්ස කුමාරයා විසින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කරන ලද දිගාමඩුල්ල ප්‍රදේශය අද හැඳින්වෙන්නේ කුමන නමකින්ද?
(1) ත්‍රිකුණාමලය (2) අම්පාර (3) පොළොන්නරුව (4) හම්බන්තොට

(17) වසභ රජු විසින් කරවන ලද ඇළ මාර්ගය සඳහන් පිළිතුර තෝරන්න.
(1) යෝධ ඇළ (2) ඇළහැර ඇළ (3) මිනිපේ ඇළ (4) පබ්බතන්ත ඇළ

(18) මහසෙන් රාජ්‍ය කාලයට අයත් නොවන සිදුවීම කුමක්ද?
(1) හුරුළු වැව නිර්මාණය කිරීම
(2) උමං ජල මාතිකා ක්‍රමය හඳුන්වා දීම
(3) ගෝකණ්ණ විහාරය ඉදි කිරීම
(4) ජේතවන ස්තූපය ඉදි කිරීම

(19) ධාතුසේන රජතුමා විසින් කරවන ලද වාරි කර්මාන්ත දෙකක් සඳහන් පිළිතුර කුමක්ද?
(1) කලාවැව හා ජය ගඟ (2) ඇළහැර ඇළ හා ජය ගඟ
(3) මින්නේරි වැව හා පබ්බතන්ත ඇළ (4) මිනිපේ ඇළ හා යෝධ වැව

(20) අනුරාධපුර යුගයේදී ඉතා දියුණුව තිබූ බටහිර වෙරළෙහි පැවති වරාය කුමක්ද?
(1) ගෝකණ්ණතිත්ථ වරාය (2) මාතොට වරාය
(3) ගොඩවාය වරාය (4) දඹකොළපටුන වරාය

## II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
* අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

(01) A හා B වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


**A**



(i) A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
(ii) එය කුමන ශිෂ්ටාචාරයකට සම්බන්ධද?
(iii) මෙහි ඇති අක්ෂර වර්ගය හඳුන්වන නම කුමක්ද?
(iv) එම අක්ෂර වලින් ලියා ඇති පැරණිම වීර කථාව ලියා ඇත්තේ කුමන රජු පිළිබඳවද?

(2 × 4 = ලකුණු 08)

**B**



(i) B රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?
(ii) එය හමුවී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?
(iii) එය භාවිත කර ඇත්තේ කවුරුන් ද?
(iv) මේවා භාවිතය තුළින් හෙළිවන්නේ කුමන චාරිත්‍රයක් පිළිබඳවද? (2 × 4 = ලකුණු 08)

Department of Education – Western Province

(02) (i) වානර පරිණාමයේ ආදීතමයින් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)
(ii) හෝමෝ නියැන්ඩතාලන්සිස් මානවයාගේ විශේෂතාවන් දෙකක් සඳහන් කරන්න.(ල.04)
(iii) පූර්ව ශිලා යුගයේ මානවයාගේ ජීවන රටාව පිළිබඳ වාක්‍ය 05 ක් ලියන්න. (ලකුණු 05)

(03) (i) මුල් ශිෂ්ටාචාර ආරම්භ වූ ගංගා නිම්න දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) පහත A,B,C,D යටතේ දක්වා ඇති දේ හා සම්බන්ධ ශිෂ්ටාචාරයේ නම් ලියන්න.
A. මුල් වරට රබර් බෝලයක් නිපදවීම
B. කඩදාසි නිෂ්පාදනය
C. සිගුරට් දේවස්ථාන තිබීම
D. පිරමීඩ නිර්මාණය (ලකුණු 04)
(iii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ පැවති සමාජ ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(04) (i) ඉන්දුනිම්න ශිෂ්ටාචාර ප්‍රදේශයට අයත් වන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් පූජක මූර්තියේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
(iii) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.(ලකුණු 05)

(05) (i) ශ්‍රී ලංකාවේ ගල් යුගයේ මිනිසා වාසය කළ ගල් ගුහා පිහිටි ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ආදී මිනිසුන් තුළ පැවති අවමංගල චාරිත්‍ර දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) විජය කුමරු ඇතුළු පිරිස ජනාවාස පිහිටුවාගත් ආකාරය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)

(06) (i) පණ්ඩුකාභය රජුගේ කාලයේ පැවති ආගම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) අනුරාධපුරය නිර්මාණයේදී අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න (ලකුණු 04)

(iii) පාසල් දරුවකු වන ඔබට පණ්ඩුකාභය චරිතයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(07) (i) මහසෙන් රජු විසින් නිර්මාණය කරන ලද වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බුදු දහමේ දියුණුව වෙනුවෙන් මහසෙන් රජු කරන ලද ක්‍රියාකාරකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මහසෙන් රජු දේවත්වයෙන් සැලකීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

Department of Education – Western Province

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2017
# Year End Evaluation

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

### ඉතිහාසය I

| | | | | |
|---|---|---|---|---|
| (1) 3 | (2) 1 | (3) 4 | (4) 2 | (5) 3 |
| (6) 2 | (7) 4 | (8) 1 | (9) 4 | (10) 3 |
| (11) 1 | (12) 4 | (13) 3 | (14) 3 | (15) 1 |
| (16) 2 | (17) 2 | (18) 2 | (19) 1 | (20) 2 |

(ලකුණු 2×20 = 40)

### ඉතිහාසය II

(01) A. (i) මැටි පුවරුවක්
(ii) මෙසපොතේමියන්
(iii) කූඤ්‍ය අක්ෂර
(iv) ගිල්ගමෙෂ් වීරු

(ල. 2×4=8)

B. (i) බෙලිකටු කෑල්ලක්
(ii) පාහියන්ගලින්
(iii) දඩයක්කරුවෝ
(iv) ආභරණ පැළඳීම

(ල. 2×4=8)

(02) (i) ඔස්ට්‍රලෝපිතිකස්, හෝමෝ හැබිලස්

(ii) ★ විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස තැනීම
★ එළවලු වර්ග පිස ආහාරයට ගැනීම
★ හොඳ දඩයක්කරුවෙකු වීම

(iii) ★ කණ්ඩායම් වශයෙන් වීම
★ තැන තැන කඳවුරු බැඳීම
★ අවමංගල චාරිත්‍ර පැවැත්වීම
★ භාණ්ඩ හුවමාරුව
★ දඩයම් කිරීම
★ ආහාර එකතු කිරීම
★ චිත්‍ර ඇඳීම
★ ගල්රූප සකස් කිරීම

(වාක්‍යයන් වශයෙන් තිබිය යුතුයි)

Department of Education – Western Province

(03) (i) යුප්‍රටීස්, ටයිග්‍රීස්, සින්දු නිම්න, හොවැංහෝ, නයිල්

(ii) A. මායා ශිෂ්ටාචාරය B. හොවැංහෝ ශිෂ්ටාචාරය

C. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය D. ඊජිප්තු ශිෂ්ටාචාරය

(iii) ★ සමාජය කොටස් හතරකට බෙදී තිබීම

★ පූජකයින් බලවත් වීම

★ හිස මුඩුකර බැටළු සම් කබා පැළඳීම

★ ඉහළ පන්තිවල ජනයා රන් ආභරණ පැළඳීම

(04) (i) ඉන්දියාව, පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය

(ii) ★ නළලේ පටි බැඳ තිබීම ★ දෑස් අඩවන්ව තිබීම

★ සන්සුන්ව භාවනා කිරීම

(iii) ★ ක්‍රමවත් ජල කාණු පද්ධති තිබීම ★ මාර්ග මැනවින් සකස් කර තිබීම

★ ළිං සකස් කිරීම ★ මුද්‍රා භාවිතා කිරීම

★ අපද්‍රව්‍යය ක්‍රමවත්ව බැහැර කිරීම ★ මුද්‍රා වලට විවිධ රූප එකතු කර තිබීම

(05) (i) පාහියන්ගල, බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන

(ii) ★ ගල්ගුහා ඇතුළත මළ සිරුර වැළලීම ★ වකුටු කර වළලා දැමීම

★ ඇට සැකිලි වල රතුපාට ආලේප කිරීම

(iii) ★ කුවේණියගේ උදවු ලබා යක්ෂයින් මර්ධනය කිරීම

★ කුවේණිය විවාහ කර ගැනීම

★ කුවේණිය හැරදමා ඉන්දියාවෙන් කුමරියක් ගෙන ඒම

★ මල්වතු ඔය කලා ඔය අසල ජනාවාස පිහිටුවා ගැනීම

★ ඉන්දියානු සමාජයේ සිරිත් විරිත් එකතු වීම

(06) (i) දේව ආගම, ජෛනාගම, බ්‍රාහ්මණාගම

(ii) ★ සීමා ලකුණු කිරීම ★ මාර්ග පද්ධති සකස් කිරීම

★ දිග අගල් ඉදි කිරීම ★ උද්‍යාන පොකුණු තැනවීම

★ දිශා හතරේ දොරටු සෑදීම ★ සුසාන තැනවීම

★ රෝහල් ඉදිකිරීම

(iii) ★ කුඩා කාලයේ ඇති වූ කරදර ඉවසීමේ ශක්තිය

★ දුක් හැරට වලට මුහුණ දීම

★ අරමුණු කරා ලඟා වීමේ ධෛර්යය

★ නොපසුබට උත්සාහය

★ ජනතාව වෙනුවෙන් කැපවීම

★ තැනට සුදුසු නුවණ

★ කළගුණ සැලකීම

★ ආගමික සහජීවනය

(07) (i) මින්නේරි වැව, හුරුළු වැව, කනදරා වැව

(ii) ★ ජේතවනාරාමය ඉදිකිරීම ★ වෙහෙර විහාර පිළිසකර කිරීම

★ ගෝකණ්ණ විහාරය වැනි විහාර ගණනාවක් ඉදි කිරීම

★ භික්ෂූන්ට සිවුරු පූජා කිරීම

(iii) ★ මින්නේරි වැව සකස් කර ජනතාවට සේවය කිරීම

★ බුදු දහමේ දියුණුවට කටයුතු කිරීම

★ රට හා ජනතාව වෙනුවෙන් වෙහෙස වී වැඩ කිරීම

★ රටවැසියාට අවංකව සේවය කිරීම

Department of Education - Western Province